**සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම - 2020/ 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව පොලී වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුහුණත නිරූපණය කළයුතු වුවද වාර්ෂික කල්බදු පොලී වියදම වන රු.1,683,333 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේ දී සිදු වී ඇති මෙම අඩුපාඩුව ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව අදාළ හෙළිදරව් කිරීම් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021/2022 මූල්‍ය වර්ෂයට අදාළ රු.1,899,144 ක නිෂ්කාශන ආදායම් (Dispatched Money) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙනත් ආදායම් යටතේ දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධිතක්සේරුවී තිබුණි. | ගිණුම් ගත කිරීමේදී සිදුවී ඇති මෙම දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ඉදිරියේ දී ගනු ලබන බව දන්වනු සිටිනු කැමැත්තෙමි. | සමාගමේ ලාභය නිවැරදි ලෙස තක්සේරු කළ යුතුය. |
| (ආ) | ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු.3,630,022 ක් වූ රැඳවුම් මුදල් තැන්පතු වටිනාකමෙන් වර්ෂයකට අධික කාලය ඉක්මවූ ඉල්ලීම් නොකළ රැඳවුම් මුදල් තැන්පතු ප්‍රමාණය රු.3,530,022 ක් වන අතර එම වටිනාකම විශ්ලේෂණය කර සමාගමේ ආදායම ලෙස හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | කාලය ඉකුත් වූ තැන්පතුවලට හිමිකම් නොපාන්නේ නම් ආදායමට බැර කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් වර්ෂයේ ආනයනික පොහොර තොග වටිනාකම අදාළ පොහොර තොග වරායට ලැබුණු දිනය (Arrival Date) පදනම් කර ගනිමින් හඳුනා ගන්නා අතර එසේ හඳුනාගත් වර්ෂයට අදාළ ආනයනික පොහොර තොගයේ ගැණුම් මිල හා තොගයේ පිරිවැය පිළිවෙලින් රු.7,547,932,485 ක් හා රු.8,287,975,191 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. උක්ත වටිනාකම් | | |

පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | ආනයනික පොහොර තොගයේ ගැණුම් මිල ලෙස ගිණුම්ගත කොට ඇති රු.7,547,932,485 ක වටිනාකම ගණනය කිරීමේදී වර්ෂය තුළ ගෙවීම් සිදු කර ඇති තොගයන්ට අදාළ වටිනාකම ගෙවීම් සිදු කළ දිනය පදනම් කර ගනිමින් හා තවදුරටත් ගෙවීම් සිදුකිරීමට ඇති තොගයන්ට අදාළ වටිනාකම එම තොගයන් වරායට ළඟා වූ දිනය පදනම් කරගනිමින් ගණනයකොට ඇතුළත්කර තිබුණි. ඒ අනුව ආනයනික පොහොර තොගයන්හි ගැනුම් වටිනාකම රු.50,969,114 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කිරීමේදී සිදු වී තිබෙන මෙම දෝෂය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | තොග නිවැරදි වටිනාකමකින් යුතුව ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | දේශීය ගැණුම්කරුවන්ගෙන් මිල දී ගත් රු.11,955,750 ක වටිනාකමකින් යුත් කාබනික පොහොර තොග, ආනයනික පොහොර තොග ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | පොහොර තොග නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදුපෙර ලාභය ගණනය කිරීමේදී කල්බදු ක්‍රමයට ලබාගත් මෝටර් රථයට අදාළ රු.4,085,984 ක වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගළපා නොතිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේ දී සිදු වී ඇති මෙම අඩුපාඩුව ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | ස්ථාවර වත්කම් සම්බන්ධ වාර්ෂික ක්ෂය ගණනය කර ගිණුම්වල ගැළපිය යුතුය. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මූල්‍ය කල්බදු ක්‍රමයට අත්පත්කර ගත් මෝටර් රථ දෙකකට අදාළව රු.3,686,895 ක මුදල් ගලාඒම් දක්වා ඇති අතර එවැනි මුදල් ගලා ඒමක් සත්‍ය වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී සිදුවී නොමැති බව විගණනයට නිරීක්ෂණය විය. | ගිණුම් පිළියෙල කිරීමේ දී සිදු වී ඇති මෙම අඩුපාඩුව ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ නිවැරදි ලෙස අදාළ ගැළපීම් සිදුකළ යුතුය. |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ කල්බදු වාරික ගෙවීම් රු. 2,228,063 ක් ලෙස දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ සත්‍ය කල්බදු වාරික ගෙවීම් හි වටිනාකම රු. 2,627,151 ක් වේ. ඒ අනුව රු. 399,088 ක ප්‍රමාණයකින් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේ දී සිදු වී ඇති මෙම අඩුපාඩුව ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ නිවැරදි ලෙස අදාළ ගැළපීම් සිදුකළ යුතුය. |
| (ඉ) | සමාගම විසින් ගිණුම් කටයුතු සඳහා දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.3,894,518 ක් වූ මෘදුකාංග පද්ධතියේ (Sever & Network) කටයුතු 2019 ඔක්තෝබර් 31 දින වන විට අවසන්කර තිබුණ ද එහි පිරිවැය තව දුරටත් නොනිමි වැඩ ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුව ඊට අදාළ සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම වන රු.1,298,171 ක් සහ පෙර වර්ෂයන්ට අදාළ ක්ෂය ප්‍රමාණය වන රු.1,839,076 ක් ගිණුම්ගතකර නොතිබුණි. මේ හේතුවෙන් ජංගම | මෙම ගැටලුව ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුගමනය කළ යුතු වීම. |

නොවන වත්කම් වටිනාකම, සමාලෝචිත වර්ෂයේ ලාභය සහ සමුච්චිත ලාභය වැඩියෙන් පෙන්නුම්කර තිබුණි.

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| පොහොර විකුණුම් ආදායම | 1,541,996,996 | 1,547,347,352 | 5,350,386 | මෙම ගැටලුව පිළිබඳව නිවැරදි අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරියේ දී සිදු කිරීමේ කටයුතු යොදනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | විකුණුම් වටිනාකම හඳුනාගෙන ගිණුම්වල දැක්විය යුතුය. |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම වෙනුවෙන් විදේශීය පොහොර සැපයුම්කරුවන් වෙත මහජන බැංකුව විසින් ගෙවා දීර්ඝකාලීන ණයකට පරිවර්තනය කරන ලද මුදලට අදාළ පොලී ප්‍රමාණය වන රු.160,447,581 ක වටිනාකම වෙනත් ලැබිය යුතු දෑ යටතේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්කර ඇතත් එම මුදල නිරවුල් කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් එකඟත්වය පළකර නොමැති අතර ඒ අනුව මෙම මුදල ප්‍රතිපූර්ණයකර ගැනීමේ හැකියාවක් නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ. | පිළිතුරු ලබාදී නොමැත. | අදාළ මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමේ හැකියාව සලකා බැලිය යුතුය. |

### 1.5.6 අනුචිත ඇගැයීම් හෝ ඇස්තමේන්තු කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් 2014/2015 සහ 2016/2017 මූල්‍ය වර්ෂයන්හිදී ජංගම නොවන වත්කම් අපහරණය වෙනුවෙන් එකතු වටිනාකම වන රු. 522,471 ක වෙන්කිරීමක් සිදුකර එය ජංගම නොවන වත්කම් වල ශුද්ධ වටිනාකමින් අඩුකර දක්වා ඇති අතර ලිපි ද්‍රව්‍ය අපහරණය කිරීම වෙනුවෙන් 2019/2020 ගිණුම් වර්ෂය තුළ රු.1,105,803 ක වෙන් කිරීමක් සිදුකර එය ලිපි ද්‍රව්‍ය තොගයෙන් අඩුකොට දක්වා ඇත. උක්ත අඩු කිරීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිළි කිරීමක් හෝ සමාලෝචිත වර්ෂය දක්වා දිගින් දිගටම එම ශේෂයන් රැගෙන ඒමට හේතු ඉදිරිපත් කිරීමක් සිදුකර නොමැත. | ඉතා පැරණි භාවිතයට ගත නොහැකි මෙම ලිපිද්‍රව්‍ය වටිනාකම පිළිබඳව ඉදිරි වර්ෂයේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | අඩු කිරීම් සම්බන්ධව ප්‍රමාණවත් හේතු දැක්විය යුතුය. |

### 1.5.7 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අප්‍රේල් 06, 07 දිනයන් හි සිදු කළ වාර්ෂික භෞතික තොග සත්‍යාපණයේදී රු. 1,496,494 ක රසායනික පොහොර තොග ඌනතාවයක් නිරීක්ෂණය විය. | මෙම ගැටලුව ද ඉදිරියේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව දන්වනු සිටිනු කැමැත්තෙමි. | තොග ඌනතාවය පිළිබඳව පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

### 1.5.8 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම වෙත නීත්‍යානුකූලව පවරාගෙන නොමැති සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටි වත්තල හුණුපිටිය ඉඩම රු.90,000,000 කට අගය කර ජංගම නොවන වත්කම් තුළ ඇතුළත් කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ගැටලුව පිළිබඳව අපගේ අවධානය යොමු වී තිබෙන අතර, මෙම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය අප සමාගම වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව අවධාරණය කරනු කැමැත්තෙමි. | ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගත යුතුය. |

### 1.6 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රසායනික පොහොර ආනයනය තහනම් කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණය නිසා සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන රසායනික පොහොර අලෙවි ආදායම සමාගමට අහිමි වීමේ අවධානමක් පැවතියමුත් වෙනත් උපායමාර්ගික මෙහෙයුම් කටයුත්තකට යොමු වීමට කළමනාකාරිත්වය අපොහොසත් වී තිබූ අතර ම සමාගම සතුව තිබූ Repo Deposit රු.300,000,000 න් රු.150,000,000 ක් එදිනෙදා වියදම් දැරීම වෙනුවෙන් යොදා ගෙන තිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තියට සමාගමීව රජයේ පොහොර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අප ආයතනයේ ප්‍රධාන වගකීමක් වේ. කාබනික පොහොර ප්‍රතිපත්තිය අනුව අප ආයතනය විසින් Sri Lanka Land Development Corporation සමඟ කොම්පෝස්ට් පොහොර මිලදී ගැනීමට ගිවිසගෙන ඇති අතර, එසේ මිලදී ගන්නා කොම්පෝස්ට් පොහොර වැඩි දියුණු කළ කාබනික පොහොර ලෙස වෙළඳපොළ වෙත නිකුත් කිරීමට ද කටයුතු කර ඇත. කෙසේ වෙතත් රජයේ ප්‍රතිපත්ති වල ස්ථාවර භාවයක් පසුගිය කාලයේ දක්නට නොලැබුණු හෙයින් උපායමාර්ගික සැළසුම් සඳහා පියවර වශයෙන් අප ආයතනය ඉදිරියට පවත්වාගෙන යන ලදී. රජයේ කාබනික පොහොර ප්‍රතිපත්තියට සමගාමීව ආයෝජනය සිදු කළේ නම් වර්තමානයේ කාබනික පොහොර ප්‍රතිපත්තියෙන් බැහැර වීම හේතුවෙන් විශාල මූල්‍ය අලාභයකට ආයතනයට මුහුණ දීමට සිදුවිය හැකිව තිබුණි. | ව්‍යාපාරික අවදානම හඳුනාගත යුතු අතර ඒ සඳහා උපායමාර්ගික සැලසුම් පිළියෙල කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10:1 උප වගන්තිය | සති අන්තයේ සහ රජයේ නිවාඩු දින වල වැඩ කිරීම වෙනුවෙන් අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව දින 02ක ඉක්මවා ගෙවීම් කර තිබුණි. | රටෙහි පොහොර අවශ්‍යතාවයෙන් 40%ක ප්‍රමාණයක් බෙදාහැරීමේ කාර්යයෙහි නියැලී සිටින අප සමාගම යල හා මහ කන්නයන්හි ඉතා කෙටි කාල පරිච්ඡේදයක් තුළ පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලිය අවසන් කළ යුතු වේ. ඒ අනුව ගොවි ජනතාවගේ අවශ්‍යතාවය මත නිවාඩු දිනයන්හි පවා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් ලබා දෙනු ලබන ඇණවුම් සම්පූර්ණ කළ යුතු වේ. මේ හේතුවෙන් ඉතා අවම කාර්යය මණ්ඩලයක් සේවය කරන අප සමාගමෙහි යල හා මහ කන්නයෙහි පොහොර අවශ්‍යතාවය කඩිනමින් සපුරාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලබා දුන් තීරණයක් මත රජයේ නිවාඩු දිනයන්හි වැඩ කිරීමට විධායක නිලධාරීන් දෙදෙනෙකු කටයුතු කර ඇත. | අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 25 දිනැති අංක PED 1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 3 වගන්තිය. | MM 1-1 සේවා ගණයට අයත් නිලධාරීන් පස් දෙනෙකු වෙත මසකට රු.10,000 බැගින් වර්ෂය තුළ දී රු.600,000 ක ඉන්ධන දීමනාවක් චක්‍රලේඛ විධිවිධාන අභිබවා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලබාදීමට කටයුතු කර තිබුණි. | පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015 මගින් මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා කණ්ඩායම් ප්‍රවාහනය සඳහා අවසර ලබා දී ඇත. ඉතා සීමිත මධ්‍යම මට්ටමේ කළමණාකරුවන් සංඛ්‍යාවක් සේවය කරනු ලබන අප සමාගමෙහි කණ්ඩායම් ප්‍රවාහනය සඳහා වාහනයක් වෙන් කර දැරීමට සිදුවන පිරිවැයට වඩා අඩු පිරිවැයක් ඔවුන් වෙත රු. 10,000/- ක දීමනාවක් ලබා දීමෙන් දැරීමට සිදුවන බැවින් එය සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය මෙම තීරණය ලබා දී ඇත. තවද මේ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ද බලාපොරොත්තු වේ. | දීමනා ගෙවීමේදී චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පර්ච්ඡේදයේ 10.1 උප වගන්තිය | 1/20 දීමනාව සඳහා හිමිකම් ලබන විධායක ශ්‍රේණියේ නිලධාරීන් කිහිප දෙනෙකු වෙත සවස 4.30 න් පසුව සේවයේ යෙදී සිටි පැය ගණන් සඳහා අතිකාල ගෙවීම් සිදුකර තිබුණි. | අප සමාගම දේශීය පොහොර අවශ්‍යතාවයෙන් 40% පමණ විශාල ප්‍රමාණයක් ඉහත අඩු නිළධාරී සංඛ්‍යාවකගේ දායකත්වයෙන් බෙදාහැරීමේ කාර්යභාරය ඉතා කාර්යක්ෂමව සිදු කරනු ලබන අතර මෙලෙස ඉහත සඳහන් කාර්යය ඉටු කිරීමේදී රාජකාරී වේලාවන්ගෙන් පරිබාහිරව රාජකාරී කිරීමට සිදු වේ. එවැනි අවස්ථාවලදී රාත්‍රී රාජකාරී කිරීමට සිදුවන නිළධාරීන් සඳහා පමණක් ඉතා කාර්යබහුල කාලවකවානු තුලදී මෙම ගෙවීම සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ. එසේ නොවන්නේ නම් ඉතා කෙටි කාලයක් තුළ විශාල පොහොර ප්‍රමාණයක් දිවයින පුරා බෙදාහැරීමේ ගැටළු මතු වීමට ඉඩ තිබෙන අතරම පොහොර ආනයන ක්‍රියාවලියේදී දවසේ පැය 24 පුරාවටම පොහොර නිශ්කාෂන කටයුතු සිදු වන බැවින් එම කටයුතුද අධීක්ෂණය කළ යුතුව ඇත. මේ නිසාවෙන් වැඩ අංශයේ විධායක නිළධාරීන්ට පමණක් මෙම දීමනාව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි තීරණයට අනුව කටයුතු කොට තිබේ. | ආයතනය සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොහොර ලැබීම, නිකුත් කිරීම, හුවමාරු කිරීම ඇතුළු පොහොර සම්බන්ධ සම්පූර්ණ ක්‍රියාවලිය පරිගණකගත කර තිබුණු නමුත් පරිගණක පද්ධතිය වෙත පෙර දිනයක යාවත්කාලීන වන සේ දත්ත ඇතුළත් කිරීමේ හැකියාව පැවතීම, අත්‍යාවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පරිගණක පද්ධතිය පිළිබඳ විගණනයේදී සෑහීමට පත්විය නොහැකිව තිබුණි. | පරිගණක පද්ධතියෙහි යම් අඩුපාඩු වෙතොත් ඒවා නිවැරදි කර ගැනීම සඳහා කටයුතු සිදු කරන බව දන්වනු කැමැත්තෙමි. | පරිගණක පද්ධති සම්බන්ධ අත්‍යාවශ්‍ය පොදු හා පද්ධති පාලනයක් පවත්වාගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.259,896,602 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.162,858,311 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.97,038,291 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම, විවිධ ආදායම් සහ නිෂ්කාශන ආදායම්හි වැඩිවීම සහ ගබඩා කුලී වියදමෙහි අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීමනා ලබාගත හැකි අතිකාල ප්‍රමාණය කිසියම් අගයකට සීමා නොකොට නිසි කළමනාකරණයකින් හා පාලනයකින් තොරව අතිකාල රාජකාරි කිරීමට ඉඩ දීම හේතුවෙන් මුළු අතිකාල දීමනා ප්‍රමාණය රු. මිලියන 11.163 ක් දක්වා ගෙවීමට සිදු වී තිබුණි. | ඉහත කරුණෙහිද සඳහන් කළ පරිදි ඉතා අවම සේවක සංඛ්‍යාවකින් දේශීය වී පොහොර අවශ්‍යතාවයෙන් 40%ක ප්‍රමාණයක් අප සමාගම විසින් ගෙන්වීම හා බෙදාහැරීම සිදු කරනු ලබන අතර ඒ හේතුවෙන් මෙලෙස අතිකාල දීමනා වැඩිපුර ගෙවීමට සිදු වී ඇති අතර පොහොර බෙදාහැරීම හා ආනයනය සිදු නොවන කාලවකවානු තුළ අතිකාල පැය ගණන සීමා කිරීමට අප කටයුතු කරන බවද දන්වනු කැමැත්තෙමි. | දීමනා ගෙවීමේදී එය නිසි පාලනයකට යටත් කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018/2019 වර්ෂය තුළ දී හම්බන්තොට බඳු ඉඩමේ ගබඩාවක් ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් දරා ඇති ප්‍රාරම්භක වියදම්වල එකතුව රු. 3,732,901 ක් වන අතර සමාලෝචිත වර්ෂය වන විට ද එම ඉඩමෙහි ගබඩාව ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර හෝ දරා ඇති ප්‍රාග්ධන වියදම්වලට අදාළ සම්පත් වෙනත් ව්‍යාපෘතියක් සඳහා උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ උක්ත වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බව නිරීක්ෂණය විය. | රජයේ පොහොර ප්‍රතිපත්තිය වෙනස්වීමත් සමඟ රසායනික පොහොර ආනයනය තහනම් වීම හේතුවෙන් පොහොර ගබඩා ඉදිකිරීමේ අවශ්‍යතාවයක් මේ වන විට පැන නැඟී නොමැත. එසේ හෙයින් එම ඉඩම වෙනත් ඵලදායි ව්‍යාපෘතියක් සඳහා යොදවා ගැනීමට අප සමාගම විසින් මේ වන විට කටයුතු කරමින් සිටින බව දන්වනු කැමැත්තෙමි. | සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත සෑම | 2020/2021 මූල්‍ය වර්ෂය පුරාවට රට තුළ පැවති "කොවිඩ් 19" වසංගත තත්වය හේතු කොට ගෙන අවස්ථා ගණනාවක දී රට වසා දැමීම ද සිදු වූ අතර, සේවකයන් සේවයට | අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, 2020/2021 මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 277 ක් ගතවීමෙන් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | කැඳවීම සීමා කිරීමට සිදු විය. මේ හේතුවෙන් නියමිත දිනයන්හි දී ගිණුම් පිළියෙළ කිරීමේ හැකියාවක් නොතිබුණ බැවින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් අප වෙත ලබා දෙන ලෙස 2021 ජුනි 03 දිනැති ලිපිය මඟින් ද ඉල්ලීමක් කොට තිබේ. එසේම 2019/2020 ගිණුම් වර්ෂයට අදාළ විගණන වාර්තාව නිකුත් කිරීමට ප්‍රමාද වී තිබීම ද මේ සඳහා හේතුවී තිබෙන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | |
| **5.** | **වෙනත් කරුණු** | | |
| (අ) | සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම අඩමාණ ණය වෙන් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වුව ද 2018/2019 වර්ෂයෙන් පසුව සමාගම විසින් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි. අඩමාණ ණය වෙන් කිරීම් ගිණුමේ රු.37,961,958 ක ශේෂය තුළ වසර දහය ඉක්මවූ ලංකා පොහොර සමාගමෙන් අයවිය යුතු රු.4,857,456 ක ශේෂයක් හා වසර හත ඉක්මවූ පෞද්ගලික ආයතන වලින් අයවිය යුතු රු.31,507,476 ශේෂයකින් සමන්විත වන අතර එම ප්‍රමාණය අඩමාණ ණය වෙන් කිරීම් වලින් සියයට 95 ක ඉහළ අගයක් ගනී.එම ශේෂයන් අයකර ගැනීම අවිනිශ්චිත වුවත් කපාහැරීමට ක්‍රියමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | අඩමාණ ණය වෙන් කිරීම් ගිණුමෙහි ශේෂයෙන් වඩා පැරණි හා අයකර ගැනීමේ හැකියාවක් නොමැති බව තහවුරු කර ගත හැකි ණයගැති ශේෂ කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර, ණය ශේෂ කපා හැරීමට අදාළව මහා භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 01/2020 අංක දරණ උපදෙස් අනුව සිදු කරනු ලබන බව දන්වනු කැමැත්තෙමි. | සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම අඩමාණ ණය වෙන් කිරීමේ සමාගමේ ප්‍රතිපත්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ආනයනික පොහොර බිල්පත් පියවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබා ගත් කෙටිකාලීන ණය මුදල් වලට අදාළ රු. 7,001,558 ක රජයේ මුද්දර ගාස්තු හා ලිපිද්‍රව්‍ය ගාස්තු බැංකු ගාස්තු ගිණුමට හර කර සමාගමේ වියදමක් ලෙස කපා හැරීම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ බැංකු ගාස්තු වියදම සියයට 5,417 ක අසාමාන්‍ය වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි. උක්ත වියදම මෙම වසරේදී ලාභයට එරෙහිව කපා හැරීම සම්බන්ධයෙන් කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අදාළ වියදම් ලාභයට එරෙහිව කපා හැරීම පිළිබඳව කරුණු අනාවරණය කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සමාගමේ සේවකයින් විසින් ඉතිරිකරගත් කෙටි නිවාඩු හා වෛද්‍ය නිවාඩු සඳහා එකතු වටිනාකම රු.2,176,747 ක නිවාඩු දීමනා හා විධායක නිලධාරීන් සඳහා එකතු වටිනාකම රු.1,196,450 වූ ඉතිරිකරගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | දීමනා ගෙවීමේදී භාණ්ඩාගාර අනුමැතීන් ලබා ගත යුතුය. |